# $450 කොරෝනා වයිරස් (කෝවිඩ්-19) පරීක්ෂණ උපකාර

$450 Coronavirus (COVID-19) testing support – Sinhalese

## සියළු දෙනා හට නොමිළේ පරීක්ෂණ

කොරෝනා වයිරස් පරීක්ෂණය සෑම දෙනෙකු හටම **නොමිළේ** ලබාගත හැකිය. මේ අය අතරට, එතෙර සිට පැමිණෙන අමුත්තන්, සංක්‍රමණ සේවකයන් සහ සරණාගත පතන්නන් ඇතුළු, මෙඩිකෙයාර් කාඩ්පතක් නැති අය ඇතුලත්වේ.

ඔබට කොරෝනා වයිරස් (කෝවිඩ්-19) සම්බන්ධ රෝග ලක්ෂණ ඇතිනම්, ඔබ විසින් පරීක්ෂණයක් කරවා ගත යුතුය.

## ඔබ පරීක්ෂණයක් කරවා ගතහොත්, වික්ටෝරියානු රජයෙන් මූල්‍ය උපකාර ලබාගත හැකිය

ඔබ විසින් කොරෝනා වයිරස් (කෝවිඩ්-19) පරීක්ෂණයක් කරවා ගතහොත්, ප්‍රතිඵල ලැබෙන තෙක් නිවසේ රැඳී සිටිය යුතුවේ. ආපදාවක් නම් පමණක් ඔබට නිවසින් පිටත්ව යා හැකිවේ. ඔබට සේවයට යාමට නොහැක.

ප්‍රතිඵල ලැබෙන තෙක් ඔබගේ රැකියාවෙන් ලැබෙන ආදායම නැතිවන බවට ඔබ කණස්සල්ලෙන් සිටීනම්, වික්ටෝරියානු රජයෙන් කොරෝනා වයිරස් (කෝවිඩ්-19) උපකාර සඳහා ලබා දෙන $450 සඳහා සුදුසුකම් තිබිය හැකිය.

මෙම උපකාර ලබා ගත හැක්කේ තමා විසින් භාවිතා කල හැකි අසනීප නිවාඩු නැති සේවකයන් සඳහාවේ. මෙම අය අතර, අනියම් සේවකයන්, කොන්ත්‍රාත් පදනම යටතේ වැඩ කරන සේවකයන්, සහ තව දුරටත් අසනීප නිවාඩු ඉතිරිවී නැති සේවකයන් සිටී.

වික්ටෝරියා ප්‍රාන්තයේ ජීවත්වන ඕනෑම අයෙකු හට මෙම උපකාර ලබාගත හැකිවේ - මේ සඳහා ඔබ ඕස්ට්‍රේලියානු පුරවැසියෙකු හෝ ස්ථිර නේවාසිකයෙකු වීමේ අවශ්‍යතාවය නැත.

ඔබට කොරෝනා වයිරස් (කෝවිඩ්-19) ආසාදනයවූ බවට සනාථ වුනිනම් හෝ කොරෝනා වයිරස් (කෝවිඩ්-19) ආසාදිත අයෙකුගේ සමීප ආශ්‍රිතයෙකු වුනිනම්, ඔබ විසින් වඩා දිගු කාලයක් ස්වයං හුදෙකලා විය යුතුය. තවද ඔබට $1500 ක උපකාර ගෙවීමක් ලබා ගැනීමටද ඉඩකඩ ඇත.

නිවසේ රැඳී සිටින ලෙස දැනම් දී ඇති දරුවන් රැක බලා ගන්නා, රැකියා කරන අය හටද වික්ටෝරියානු රජය මගින් මෙම මූල්‍ය උපකාරය දෙනු ලැබේ. තවද, ඔබට රැකියාවට යාමට නොහැකිවීම හේතුවෙන් වේතන අහිමි වේ නම්ද, මෙම උපකාරය ලබාගත හැකිවේ.

වැඩිදුර විස්තර හෝ අයදුම් කිරීම සඳහා, දුරකථන අංක 1800 675 398 ඔස්සේ කොරෝනා වයිරස් හොට්ලයින් අමතන්න, නැතිනම්, www.dhhs.vic.gov.au/covid-19-worker-support-payment යන වෙබ් අඩවිය වෙත පිවිසෙන්න.

**For information in other languages, scan the QR code or visit DHHS.vic –Translated resources - coronavirus (COVID-19) <https://www.dhhs.vic.gov.au/translations>**

**If you need an interpreter, call TIS National on 131 450**

**For any questions**

**Coronavirus hotline 1800 675 398 (24 hours)**

**Please keep Triple Zero (000) for emergencies only**

VICTORIA State Government | Health and Human Services

**OFFICIAL**

To receive this document in another format phone 1300 651 160 using the National Relay Service 13 36 77 if required, or email Emergency Management Communications <em.comms@dhhs.vic.gov.au>.

Authorised and published by the Victorian Government, 1 Treasury Place, Melbourne.

© State of Victoria, Australia, Department of Health and Human Services, 16 October 2020.
Available at **https://www.dhhs.vic.gov.au/translations**



**OFFICIAL**